# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1802/20 - 2013 මාර්තු 22 වැනි සිකුරාදා - 2013.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව

**ආදාහනාගාර අතුරු ව්‍යවස්ථාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (VII) උප වගන්තියේ (ඌ) ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා ආනුෂංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බල පවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2013 ජනවාරි මස 08 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

1. මෙම අතුරු ව්‍යවස්ථා මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර කටයුතු පාලනය හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

2. මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරය භාවිතා කිරීම, පාලනය කිරීම හා එකී ආදාහනාගාරය භාවිතා කිරීම සඳහා වන ගාස්තු නියම කිරීම සහ අයකිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයක කිසිම මෘත ශරීරයක් හෝ මෘත ශරීරයක කොටසක් හෝ මිනිස් කළලයක් ආදාහනය නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාවල තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන මෙහි මතු ඉල්ලුම්කරු යැයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් "1" උපලේඛනයට අනුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයක් පහත සඳහන් ලියකියවිලි සමඟ සභාපතිවරයා වෙත හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය :–

(i) මිය ගිය අය හා අයදුම්කරු අතර ඥාතීත්වය තහවුරු කළහැකි ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු ය (මේ සඳහා මිය ගිය අය පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් හෝ සභාවේ ගරු සභිකයෙකු විසින් හෝ නිකුත් කරන ලද සහතිකයක් හෝ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ විවාහ සහතිකය හෝ වෙනත් එවැනි සහතිකයක් ප්‍රමාණවත් වේ.)

(ii) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක පිටපතක් හෝ අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් ලියවිල්ලක් ;

(iii) 1975 අංක 41 දරන විවාහ උප්පැන්න හා මරණ (සංශෝධිත) පනතේ සංශෝධිත උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ අංක 110 වැනි පරිච්ඡේදයේ 11 වැනි වගන්තියේ විධිවිධාන යටතේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලැබූ මරණ ලියාපදිංචි කිරීමේ සහතිකයේ අම්පිටිය මැද්දේපතන ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ආදාහනය කරන බවට සඳහන් වී තිබිය යුතු ය.

(iv) මිය ගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ අංක 41 (අ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය ;

(v) අජීවී උපතකින් සිදු කරන ලද මෘත ශරීරයක් නම් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

5. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, සභාපති හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබෙන අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු වන්නේ ය. ඒ අනුපිළිවෙළ මත ආදාහන වේලාව නියමකර අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

6. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාර ගාස්තු ලෙස ප්‍රාදේශීය සභාව තුළ රු.5000 ක ගාස්තුවක් හා ප්‍රාදේශීය සභාවෙන් පිටත රු.5500 ක ගාස්තුවක් මෙම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු ය. මෙම ගාස්තු ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියක් මගින් වරින්වර සංශෝධනය කළ හැකි ය. එකී ගාස්තු ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කළ යුතු ය. එම ගාස්තු සභා කාර්යාලයේ සහ ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කළ යුතු ය.

7. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම්, ඒ බව සහ එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට අයදුම්පත ලද වහාම දැන්විය යුතු ය.

8. සෑම දිනක ම පෙරවරු 06.00 සිට පස්වරු 06.00 කාලය අතරතුර පමණක් ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරදිය යුතු ය. ඉන් ඔබ්බට ආදාහනය සඳහා අවසර දෙනු නොලැබේ.

9. ඉල්ලුම්කරු විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති වේලාවට හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහන භාරකරු වෙත භාරදිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් මෙම ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

10. සෑම ආදාහනාගාරයක ම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය මියගිය අයගේ නම සහ ඔහු මියයාමට පෙර පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු සහ මියගිය තැනැත්තා සමඟ තිබූ සම්බන්ධතාවය, ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ඇතුළත් ලේඛනයක් ආදාහනාගාරය භාරකරු විසින් පවත්වාගෙන යා යුතු ය.

11. ආදාහනාගාරයේ දේහය ආදාහනය කරන අවස්ථාවේ යාන්ත්‍රික දෝෂයක් මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත් සභාපතිවරයාගේ උපදෙස් මත එකී දේහය පිළිබඳව වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉල්ලුම්කරු විසින් එකඟ විය යුතු ය.

12. මෘත ශරීරය ආදාහනය කර දින 21 ක් ගත වීමට ප්‍රථම ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් භෂ්මාවශේෂ භාරගත යුතුවේ. නියමිත කාලය තුළ භාරගනු නොලබන භෂ්මාවශේෂ පොදු වලක භූමදානය කරන අතර, එවැනි අවස්ථාවක ඒ පිළිබඳ කිසිවෙකුටත් සභාවට එරෙහිව නීතිමය පියවර ගැනීමට හිමිකම් නොමැත්තේය.

13. මීට අමතරව මැද්දේපතන ආදාහනාගාරයේ ආදාහනය කරනු ලැබූ මෘත ශරීර වල භෂ්මාවශේෂ මැද්දේපතන සුසාන භූමිය වටා ඇති තාප්පයේ කොටසක් ඉදිකර එහි තැන්පත් කිරීමද කළ හැකිය. මේ සඳහා මිය ගිය අයගේ ඡායාරූපයද එම ඉදිකරන කොටස තුල ප්‍රදර්ශනය කළ හැකි අතර, එම ඉදිකිරීම වෙනුවෙන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් අයකරනු ලැබිය හැකිය.

14. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරයක් නොමැති ව ආදාහනාගාරයේ පරිශ්‍රයට ඇතුළුවීම වරදකි. එසේ වුවද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍ර ලාභියකු සමඟ පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති බව සලකනු ලැබේ.

15. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපළවලට අලාභ හානි කිරීම හෝ ආදාහනාගාර භාරකරුට හෝ ඔහුගේ සහායකයින්ට හෝ රාජකාරි කටයුතුවලට බාධා කිරීම හෝ නොකළ යුතු ය. එවැනි අලාභයක් හෝ හානියක් සිදුවුවහොත් එකී ආදාහනයට අදාළ වූ අවසරපත්‍රධාරියා එයට වගකිව යුතු වේ. එවැනි අලාභයක් තක්සේරු කිරීමෙන් අනතුරු ව එම අලාභය බලපත්‍රධාරියා වෙත දැන්වීමෙන් පසුව ඔහු විසින් එම වටිනාකම ගෙවිය යුතු ය. එම ගෙවීම පැහැර හරින්නේ නම් නිසි බලයලත් අධිකරණයක් හමුවට පමුණුවා එකී මුදල්ද දඩයක් පරිදි අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

16. ආදාහනාගාරය තුළ සැරසිලි කිරීම මෙම ප්‍රාදේශීය සභාවේ ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතු ය.

17. ආදාහනාගාරය නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යම් කිසි කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකට ව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

18. මේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක්වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් එම වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් නොකඩවා කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා හෝ වෙනත් බලයලත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමෙන් භාර දෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම සිදු කිරීම නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනය පිළිවෙලින්. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ -

i "සභාව" යන්නෙන් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව ද,

ii "සභාපති" යන්නෙන් තත්කාලයෙහි බලපවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූල මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවට පත්කර ගන්නා ලද සභාපති වරයා ද,

iii "මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යයෙකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහිකරන ලද සිරුරක් ද,

iv "ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදාහනාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු ද යන්නෙන් අදහස් වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

උපලේඛනය I

*මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ අම්පිටිය මැද්දේපතන ආදාහනාගාරයේ*
*මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසර පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :———.
ලිපිනය :———.
ජාතික හැඳුනුම්පත් අංකය :———.
ග්‍රාම නිලධාරි වසම :———.

02. මියගිය අයගේ සම්පූර්ණ නම :———.
මියගිය අයගේ ලිපිනය :———.
ජාතික හැඳුනුම්පත් අංකය :———.
ග්‍රාම නිලධාරි වසම :———.
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :———.

03. අයදුම්කරු හා මියගිය අය අතර ඇති ඥාති සම්බන්ධතාවය :———.

04. මරණ සහතිකයේ අංකය හා දිනය :———.

05. රෙජිස්ට්‍රාර්ගේ නම අත්සන හා ලිපිනය :———.

06. මියගිය අයගේ මරණයට හේතුව :———.

07. මරණ පරීක්ෂණයක් තිබුණේ නම් එය පැවැත්වූ
දිනය හා වේලාව :———.

08. මරණ පරීක්ෂකගේ නම හා තනතුර :———.

09. මරණ පරීක්ෂකගේ තීරණය :———.

10. මෘත ශරීරය ආදාහනය සඳහා අවසර ලැබුණේ ද/
නොලැබුණේ ද යන වග :———.

11. ආදාහනය කිරීමට අදහස් කරන දිනය හා වේලාව :——— .
12. අයදුම්කරුගේ දුරකථන අංකය :——— .

ඉහත මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. ඊට අවශ්‍ය සියලු සහතික මේ සමග අමුණා ඇත.

................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...................................

*(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) :*

1. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි.

......................................................
ලේකම්,
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව.

......................................................
සභාපති/බලය පැවරූ නිලධාරියා,
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව.

දිනය :——— .

දිනය :——— .

2. අංක ........................................ හා ....................................... දිනැති ලදුපතින් රු. ............................................... ක් අය කරන ලදී.

3. ඉල්ලීම ඉටු කිරීමට අවසර දීම නිර්දේශ කරමි/නොකරමි.............................................

4. නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු : ...................................................

......................................................
විෂය ලිපිකරු.

දිනය :———

04 -248

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.